# මගේ බෝංචි වැල



සෙනුලි බිහන්සා කාරියවසම්

# මගේ බෝංචි වැල

## සෙනුලි බිහන්සා කාරියවසම්

<u>කතෘගේ වෙනත් කෘති</u>

අකීකරු සෙනුට පාඩමක්

පාසල - මහාමායා බාලිකා විදුහල

පන්තිය - 3 ශ්‍රේණිය D

පළකරන දිනය 2026-05-10

**ISBN 978-624-211-044-8**

# පිදුම

පොතක් ලියන්නට

මාගේ ඇස් පෑදූ

ආදරණීය වත්සලා ගුරු මෑණියන්ට

සෙනෙහසින් පුදමි.



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.


ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

සෙනුලිගෙයි තෙනුලිගෙයි ගෙදරට එළවළු ගේන්නේ ගෙදර ළඟම තියෙන එළවළු කඩෙන්. සමහර දවසට මේ දෙන්නත් එළවළු ගන්න අම්මත් එක්ක කඩයට යනවා.



උදේම කඩයට ගිය සෙනුලිට පාට පාට එළවළු දැකලා හරි සතුටුයි. බෝංචි , කැරට් ,බීට්රූට් , වම්බටු, තක්කාලි හරිම පිළිවෙළට කඩේ මාමලා අසුරලා තිබුණා.



"මේ එළවලු වවන්නේ කවුද අම්මේ" සෙනුලි ඇහුවා.

ගොවි මාමලා ගොඩාක් මහන්සි වෙලා තමයි මේ එළවළු වවන්නේ පුතාලට කන්න අම්මා කිවුවා.



"අනේ අම්මේ මටත් ආසයි එළවළු වවන්න. අපිත් හදමුකෝ" සෙනුලි කිව්වේ හරිම සතුටෙනි. "අපි බෝංචි වගා කරමුද" සෙනුලිගේ අදහසට අම්මාත් කැමති වුණා. එදාම හවස තාත්තා සෙනුලිට බෝංචි ඇට පැකට් එකක් ගෙනත් දුන්නා.

තාත්තා පස් කොටලා බෝංචි ඇට හදන්න පාත්තියක් හදලා දුන්නා. සෙනුලි ඒ පාත්තියේ බෝංචි ඇට ටික පේළියට හිටවලා වතුර දැම්මා.



දින කිහිපයකට පසු උදෙන්ම නැගිටලා බෝංචි පාත්තිය බලන්න ගිය සෙනුලිට බෝංචි ඇට පැළවෙලා තියෙනවා දැක්කම හරි සතුටුයි.



හැමදාම හවසට සෙනුලි නංගිත් එක්ක එකතු වෙලා පැල වලට වතුර දැම්මා. වත්ත පහළ කොළරොඩු එකතු කරන තැනෙන් අම්මා කොම්පෝස්ට් පොහොර ගෙනත් දීලා ඒවා පැලවලට දමන්න උදව් කළා.



"දැන් බෝංචි පැළ වැල් වගේ හැදිලා නිසා මේවාට ආධාරකයක් ඕන" කියලා තාත්තා කිවුවා. ලී වලින් සාදා දුන් ආධාරකය නිසා බෝංචි පැළ ටික සරුවට හැදුණා.



ඒත් එක දවසක් බෝංචි වැල් බලන්න ආව සෙනුලි දැක්කේ සමහර කොළ කවුදෝ කාලා දාලා පැළ ටිකට හානි වෙලා තියෙනවා. මේක දැකලා සෙනුලිට හරි දුකයි.



"පැළ හදලා විතරක් මදි සතුන්ගෙන් පරිස්සම් කරගන්නත් ඕන" තාත්තා කිවුවා. සතුන් කා දැමු කොළ ටික තාත්තා පාත්තියෙන් ඈතට ගිහින් දැම්මා. ලූණු පොතු සහ කොහොඹ කොළ වලින් හදපු බෙහෙතක් තාත්තා බෝංචි පැළවලට දැම්මා.



ටික දවසකට පසු බෝංචි වැලේ පිපුණු දම් පාට මල් දැකලා සෙනුලිට හරි සතුටුයි. සරු පසක හදලා පොහොර, හිරු එළිය,ජලය හොඳින් ලැබුණ නිසයි බෝංචි කරල් හැදෙන්න පටන් ගත්තා. දළඹුවන්ගෙන් , ගොළුබෙල්ලන්ගෙන් පැළ ටික පරිස්සම් කරගන්න මේ දෙන්නා මහන්සි වුණා.



"පුතේ දැන් ඔයාගේ බෝංචි වැල්වල කරල් කඩන්න පුළුවන්"තාත්තා එහෙම කිව්ව ගමන් සෙනුලියි තෙනුලියි දුවලා ගිහින් වට්ටියක් අරගෙන ආවා. බෝංචි කරල් ගොඩාක් කඩාගත්තා . අම්මා එදා හවස සෙනුලිට රසට බෝංචි උයලා දුන්නා.



අල්ලපු ගෙදර නැන්දලාට අත්තම්මලාටත් සෙනුලි බෝංචි කරල් දුන්නා.



"දැන් පුතාලට තේරෙනවා නේද ගොවි මාමලා කොච්චර මහන්සි වෙලාද එළවළු හදන්නෙ කියලා ඒ නිසා කෑම ජාති නාස්ති කරන්නේ නැතිව ආහාරයට ගන්න පුරුදු වෙන්න ඕන" තාත්තා ආදරයෙන් ඔළුව අතගාලා කියලා දුන්නා.





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

# ස්තූතිය.

අකුරු කරන්නට සෙවණ ලබා දුන් මහනුවර මහාමායා බාලිකා විදුහලේ විදුහල්පතිතුමියටත් ප්‍රාථමික අංශයේ විදුහල්පතිතුමියටත් කතන්දරයේ අඩුපාඩු පෙන්වා දුන් වත්සලා ගුරුතුමියටත් ආදරණීය අම්මාටත් , තාත්තාටත් සහෝදරියටත් ස්තූතිය පුද කරමි.